# අධ්‍යාපන කාර්යය සාධනය කෙරෙහි බලපාන සාධක

කේ.ඩී. ප්‍රදීපිකා චතුරංගි[1]

**සංක්ෂේපය**

අධ්‍යාපනයට හිමිවන වටිනාකම දිනෙන් දින ම ඉහළයාම අධ්‍යාපනයේ වැදගත්කම තව දුරටත් තීව්‍ර කරයි. කෙසේ වුව ද අධ්‍යාපන කටයුතු සිදුකරන සිසුන්ගේ සාධන මට්ටම දෙස අවධානය යොමු කරන විට සිසුන්ගේ සාධන මට්ටමෙහි විවිධත්වයක් පවතින බව පැහැදිලි වේ. ඒ අනුව සිසුන්ගේ සාධන මට්ටමේ විවිධත්වයක් ඇති වීම සඳහා සිසුනට සමාජ, ආර්ථික සාධක බලපෑම් කරනවා ද? ඒ කුමන සාධක ද? යන ගැටලුව පැන නඟී. එම ගැටලුවට විසඳුම් සෙවීමේ අරමුණින් මෙම ලිපිය තුළින් අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන සමාජ ආර්ථික සාධක පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. අධ්‍යාපන සාධනයට බලපාන සමාජ, ආර්ථික සාධක මොනවාදැයි සොයා බැලීම සඳහා ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පාසල් තුනකින් සිසුන් 80ක නියැදියකින් ලබාගත් ප්‍රාථමික දත්ත ඇසුරින් කල්පිත පරීක්ෂාව සහ බහුගුණ ප්‍රතිපායනය මඟින් යම් නිගමනයන්ට එළඹීමට සිදු විය. එහි දී අධ්‍යාපන සාධනය සඳහා වැඩි වශයෙන් බලපෑම් කරන සාධක ලෙස දෙමව්පියන්ගේ ආදායම, දරුවන් පාඩම් කටයුතු සිදුකරන කාලය, අධ්‍යාපනය සඳහා මාසික වියදම, මවගේ අධ්‍යාපන මට්ටම, දරුවන් උපකාරක පංතිවලට සහභාගී වීම යනාදිය හඳුනා ගැනීමට හැකි විය.

**මුඛ්‍ය පද:** *අධ්‍යාපනය සංකල්පය, අධ්‍යාපනය සාධනය*

## හැඳින්වීම

ලෝකයේ සෑම රටක ම අධ්‍යාපනයට වැදගත් ස්ථානයක් හිමිවන අතර සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ ද අධ්‍යාපනය සඳහා ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. අධ්‍යාපනය සඳහා රජය මහජන මුදලින් සැළකිය යුතු ප්‍රමාණයක් වෙන් කරන අතර දෙමව්පියන් විසින් ද තම දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා යම් කිසි මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබයි. දරුවන් අතර අධ්‍යාපනය ලැබීම සඳහා තියුණු තරඟයක් පවතින අතර දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට දෙමව්පියන් අතර ද තරඟයක් පවතී. එයට හේතුව වන්නේ අධ්‍යාපනය අනාගත ආයෝජනයක් වශයෙන් හඳුනා ගෙන තිබීමත් එයින් අත්වන ප්‍රතිලාභ ඉහළ වටිනාකමකින් යුක්ත වීමත් ය. අධ්‍යාපනය ලබා දී ම තුළින් මානව සම්පතේ ගුණාත්මක භාවය ඉහළ නංවාලීමට හැකි ය. රටක මානව

---

[1]සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර,
Pradeepikachathurangi90@gmail.com

සම්පත ගුණාත්මක බවින් ඉහළ නම් එම රටේ සංවර්ධනයට මානව සම්පතින් විශාල දායකත්වයක් ලැබීම දැකගත හැකි ය. එබැවින් වර්තමානය වන විට අධ්‍යාපනය සියලු දෙනාට ම අත්‍යවශ්‍යය සාධකයක් බවට පත්ව තිබී ම හඳුනාගත හැකි ය.

ලංකාවේ අධ්‍යාපනය දෙස අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ අධ්‍යාපනය ලැබීම සඳහා දැඩි තරඟකාරී ස්වරූපයක් පවත්නා බව යි. ඉහළ අධ්‍යාපන මට්ටමක් ලබා සිටින දෙමව්පියන් මෙන්ම පහළ අධ්‍යාපන මට්ටමක් ලබා සිටින දෙමව්පියන් ද තම දරුවන් හට අධ්‍යාපනය ලබාගැනීමට අවශ්‍යය පහසුකම් ලබා දෙන සේ ම අධ්‍යාපනය ලබාගැනීමට ඔවුන් උනන්දු කර වීම ද දැකගත හැකි ය. මේ සඳහා හේතුව වන්නේ අධ්‍යාපනය අනාගතය සඳහා කරන ආයෝජනයක් වීමත් අනාගතයේ දී එයින් අත්වන ප්‍රතිලාභයන් ඉහළ මට්ටමක පැවතීමත් ය. ශ්‍රී ලංකාවේ රජයේ පාසල් තුළ ක්‍රියාත්මක වන්නේ එක ම විෂය නිර්දේශය කි. එමෙන් ම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා රජය ජාතික ආදායමින් යම් පිරිවැයක් දරනු ලබ යි. එක ම වයස් කාණ්ඩයකට අයත් දරුවන්ගේ අධ්‍යාපනයේ සාධනීය මට්ටම දෙස අවධානය යොමු කරන විට පැහැදිලි වන්නේ දරුවන්ගේ අධ්‍යාපන සාධනයේ විවිධත්වයක් පවතින බව යි.

**අධ්‍යාපනය සංකල්පය අර්ථ දැක්වීම**

වර්තමානයේ අධ්‍යාපනය නමැති සංකල්පය සමාජයෙන් බැහැර කිරීමට නොහැකිවන තරමට ම සියලු ම දෙනාට අත්‍යවශ්‍යය සංකල්පයක් බවට පත්ව තිබේ. අධ්‍යාපනය නමැති සංකල්පය බාහිරින් දැකගත නොහැකි, ස්පර්ශ කළ නොහැකි දෙයක් වන නිසා අධ්‍යාපනය යනු කුමක්දැයි නිශ්චිත ව අර්ථ දැක්වීමට අපහසු ය. 'Educo' (එඩුකෝ) යන ලතින් වචනයෙන් 'Educate' (එඩියුකේට්) යන ඉංග්‍රීසි වචනය නිර්මාණය වී තිබේ. අධ්‍යාපනය නමැති සංකල්පය කෙටියෙන් හැඳින්වීම හෝ සරල නිර්වචනයක් ඉදිරිපත් කිරීම කළ නොහැකි ය. එයට හේතුව වන්නේ සංකීර්ණ සමාජයක ජීවත්වන මිනිසාගේ සජීවී ජීවිතය හා සම්බන්ධවන අධ්‍යාපනය ද ඉතා සංකීර්ණ දෙයක් වීම යි. එපමණක් නොව අධ්‍යාපනය නමැති සංකල්පය ඉතා පුළුල් ක්ෂේත්‍රයකින් සමන්විත වීම ද තවත් හේතුව කි. අධ්‍යාපනය සංකල්පයක් නිසා නිශ්චිත අර්ථකථනයක් ඉදිරිපත් කළ නොහැකි ය. නමුත් අධ්‍යාපනය පිළිබඳ ව විවිධ විද්වතුන් ඉදිරිපත් කළ අදහස් හඳුනා ගැනීමට හැකි ය. ප්‍රැන්සිස් බේකන් නමැති මනෝවිද්‍යාඥවරයා පවසන ආකාරයට ප්‍රීතිමත් වාසනාවන්ත ජීවිතයක් ගෙනයාමට හැකිවන පරිදි බුද්ධිය වර්ධනය කිරීමත්, ජීවන තත්ත්වය නංවාලීමත්, අධ්‍යාපනය නම් වෙයි (රත්නාවතී, 1999). අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ දැනුම ලබා දීම හෝ ලබාගැනීම පමණක් නොවේ. දැනුම ලබා දීම හෝ ලබා ගැනිම අධ්‍යාපනයේ එක් අංශයක් මිස සමස්තය ම නොවේ. අධ්‍යාපනය ආරම්භ වන්නේ ද්‍රව්‍යයන් හා පුද්ගලයන් ආශ්‍රයෙනි. ද්‍රව්‍යයන්ගෙන් ලබන අධ්‍යාපනයට වඩා පුද්ගලයන්ගෙන් ලබන

අධ්‍යාපනය හෙවත් අත්දැකීම් විවිධ ය. අධ්‍යාපනය ද්‍රව්‍යයයන් මෙන් පරිහරණය කිරීමෙන් අත්දැකීම් ලබාගත නොහැකි අතර පුද්ගලයන් හා ජීවත් වීමෙන් අත්දැකීම් ලබාගත යුතු ය. එලෙස පුද්ගලයන් හා ජීවත් වීමෙන් අධ්‍යාපනය ලබා ගන්නා නිසා ද අධ්‍යාපනය සමාජයීය ක්‍රියාවක් වෙ යි. ඒ අනුව අප එදිනෙදා ජීවිතයෙ දී මුහුණදෙන ගැටලු, අවස්ථා, සිද්ධි, විපර්යාස මේ සියල්ල ම අධ්‍යාපනය වශයෙන් සැළකිය හැකි ය. පංචේන්ද්‍රියයන් මගින් අධ්‍යාපනය ලබාගන්නා පුද්ගලයා පංචේන්ද්‍රියයන් මඟින් ලබාගන්නා විවිධ දෑ ඒ ඒ පුද්ගලයාට ආවේණික බුද්ධි මට්ටම් අනුව ග්‍රහණය කොට තේරුම් ගෙන ඒ අනුව ක්‍රියාත්මක වීම සිදු වෙයි. මෙම ක්‍රියාවලියට ඉගෙනුම යැයි කියනු ලැබේ. මේ අනුව අධ්‍යාපනය යනු කුමක්දැයි නිශ්චිතව ම හැඳින් වීමට අපහසු නමුත් සරල අර්ථයෙන් ගත් කල අධ්‍යාපනය යනු පෞද්ගලික හා සමාජයීය අන්තර්ක්‍රියා තුළින් ක්‍රියාත්මක වන්නා වූ වියුක්ත සංකල්පයක් වන බව පැහැදිලි කරුණ කි.

## අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන සාධක

එක ම වයස් කණ්ඩායමක් තුළ සිටින සිසුන්ගේ සාධනය දෙස අවධානය යොමු කරන විට එක් එක් සිසුන් විවිධ සාධන මට්ටම් පෙන්නුම් කරන ආකාරය අවබෝධ කර ගැනීමට හැකි වේ. අධ්‍යාපන සාධනය කෙරෙහි එක් සාධකයක් පමණක් නොව සාධක රාශියක් බලපාන බව ලෝකය පුරා මෙතෙක් සිදු කෙරී ඇති පර්යේෂණවලින් අනාවරණය කරගෙන ඇත. ලෝකයේ පමණක් නොව ලංකාවේ ද අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන සාධක පිළිබඳව විවිධ පර්යේෂණ සිදුකර තිබේ. ඒ අනුව විවිධ පර්යේෂණ මගින් අනාවරණය කරගෙන තිබෙන අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන සාධක කිහිපයක් පහත ආකාරයට අවබෝධකර ගැනීමට හැකි වේ.

## දෙමව්පියන්ගේ ආදායම් මට්ටම

දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමව්පියන් වැය කරන මුදල් ප්‍රමාණය තීරණය වන්නේ ඔවුන්ගේ ආදායම අනුව ය. පවුලේ ආදායම් මට්ටම ඉහළ අගයක් ගනී නම් එහි දී දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වැයකරන මුදල් ප්‍රමාණය ඉහළ මට්ටමක පවතී. දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වැයකරන මුදල් ප්‍රමාණය වැඩි වන විට දරුවන් අත්කර ගන්නා සාධන මට්ටම ඉහළ තත්ත්වයක පවතින බව ද විවිධ පර්යේෂණ මඟින් අනාවරණය කර ඇත (ගලගමගේ, 2006). ශ්‍රී ලංකාවේ මහර අධ්‍යාපන මණ්ඩලයේ පාසල් හැර යන්නන් පිළිබඳ අධ්‍යයනයක් කරන වික්‍රමසිංහ (1978) අධ්‍යාපනය කෙරෙහි බලපාන පවුල්, සමාජ හා ආර්ථික පසුබිම සම්බන්ධ සාධක අනාවරණය කර ඇත. ඒ අනුව පවුලේ ආදායම අඩුවන විට දරුවන් පාසල හැර යාම වැඩි වන බව අනාවරණය කරගෙන තිබේ (වික්‍රමසිංහ, 1978). ශ්‍රී ලංකාවේ ද දෙමව්පිය රැකියා මට්ටම අනුව දරුවන්ගේ අධ්‍යාපනය තීරණාත්මක

තත්ත්වයක පවතී. ලෝකයේ බොහෝ රටවල්වල දෙමව්පියන්ගේ රැකියාව හා දරුවන්ගේ අධ්‍යාපනය සැසඳී ම සඳහා යොමු වී ඇත.

**දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම**

සියලු ම දෙනාගේ ළමා කාලයේ මුල් ගුරුවරු වන්නේ දෙමව්පියෝ ය. දරුවන් මුලින් අකුරු හඳුනාගැනීමටත්, ලිවීමටත්, ඉගෙන ගන්නේ දෙමව්පියන්ගෙනි. නිවස තුළ ඒ සඳහා උචිත වාතාවරණයක් ගොඩනැගී තිබිය යුතු ය. මේ සඳහා දෙමව්පියන්ගේ උනන්දුව හා පෙළඹවී ම නිවසේ දී කෙරෙන අධ්‍යාපන කටයුතු කෙරෙහි පමණක් නොව පාසලේ දී ඒ ඒ අධ්‍යාපනික අංශ හා විෂය ක්ෂේත්‍රයන් කොතරම් දුරට කෙරී ඇද්ද ඒවායේ ප්‍රගතිය කෙසේ ද යනාදිය සොයා බලන දෙමව්පියන්ගේ දරුවන් අධ්‍යාපන සාධනයෙන් ඉහළ මට්ටමක සිටින බව වික්‍රමසිංහ (1978) කරන ලද පර්යේෂණයකින් අනාවරණයකර තිබේ. දෙමව්පිය අධ්‍යාපන මට්ටම හා ආකල්ප දරුවන්ගේ අධ්‍යාපනයට සම්බන්ධ බව හැල්සි, හීත් හා රිජ් යන තිදෙනා බ්‍රිතාන්‍යයේ කරන ලද අධ්‍යයනකින් තහවුරු කර ඇත (ගලගමගේ 2006). විශේෂයෙන් ම මවගේ අධ්‍යාපන මට්ටම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි ඍජුව ම බලපාන ආකාරයක් දැකිය හැකි බව ඉන්ද්‍රජිත් (1997) කරන ලද පර්යේෂණයකින් අනාවරණය කර ඇත. විශේෂයෙන් දරුවාගේ අධ්‍යාපනය කෙරෙහි මවගේ උනන්දුව, දරුවන්ගේ අධ්‍යාපනයට උදව් කිරීමට මවට ඇති හැකියාව, දරුවන්ට හොඳ පෝෂණ තත්වයක් ලබා දීම ආදිය අතින් අධ්‍යාපන මට්ටම ඉහළ මව්වරු අනෙක් මව්වරුන්ට වඩා ඉදිරියෙන් සිටින බව එම පර්යේෂණය මගින් අනාවරණය කර තිබේ. Stricht සහ McDonald, 1990 දී සිදුකරන ලද පර්යේෂණයකින් අනාවරණයකර තිබෙන්නේ උගත්කමින් ඉහළ මව්වරුන්ගේ දරුවන් අධ්‍යාපන සාධන මට්ටමෙන් සහ කුශලතා සාධනයෙන් ඉහළ මට්ටමක සිටින බව යි. එමෙන් ම Benjamin, 1993 දී සිදුකරන ලද පර්යේෂණයකින් අනාවරණය කර තිබෙන්නේ ද පාසලේ සාධන මට්ටම ඉහළ සිසුන්ගේ මව්වරු ඉහළ අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බව ය. එමෙන්ම රත්නාවතී, 2003 සිදුකර ඇති පර්යේෂණයෙන් අනාවරණයකර තිබෙන්නේ ද පියාගේ අධ්‍යාපන මට්ටමට වඩා මවගේ අධ්‍යාපන මට්ටම දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම කෙරෙහි බලපෑම් කරන බව යි. දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම සහ දරුවන්ගේ අධ්‍යාපනයේ සාධනය අතර සම්බන්ධයක් පවතින බව විවිධ පර්යේෂණ ආශ්‍රයෙන් තහවුරු කර තිබෙන බව මේ අනුව පැහැදිලි වේ.

**මවගේ සේවා නියුක්තිය**

වර්තමානයේ සමාජ රටාව ශීඝ්‍රයෙන් වෙනස් වීමකට ලක්වෙමින් පවතින ආකාරයක් හඳුනා ගැනීමට හැකි ය. අතීතයේ කාන්තාව දරුවන් රැකබලා ගැනීම සහ නිවසේ කටයුතුවල පමණක් නිරත වුව ද අද වනවිට ඇය රැකියාවල ද නිරත වෙයි. මේ හේතුව නිසා දරුවන්ගේ අධ්‍යාපන

කටයුතුවලින් මව යම් ආකාරයකට ඈත් ව තිබීමක් දැකිය හැකි ය. මෙම තත්ත්වය දරුවන්ගේ අධ්‍යාපන සාධනයට ඇති කරන බලපෑම විවිධ පර්යේෂකයින් විසින් අනාවරණය කර තිබෙ යි. හැල්සි, ජ්ලවුඩ් හා ඈන්ඩර්සන් යන අය බ්‍රිතාන්‍යයේ කරන ලද පර්යේෂණයකින් තවදුරටත් කරන ලද පර්යේෂණයකින් අනාවරණයකර තිබෙන්නේ මව්වරුන් තම නිවෙස්වලින් බැහැර ප්‍රදේශවල රැකියා සඳහා නික්ම යාමෙන් දරුවන්ගේ අධ්‍යාපනික සාධනය අඩාල වන බව ය (ගලගමගේ 2006). මව රැකියාවල නිරත වීම දරුවන්ගේ අධ්‍යාපනයට අහිතකර ලෙසින් බලපාන බව එෆ්. මැස්ග්‍රෝ (1966) තම අධ්‍යයනයක් තුළින් හඳුනා ගැනිණ. දරුවන් තුළින් උසස් අධ්‍යාපනික ආකල්පයන් හා රැකියා පිළිබඳ ආකල්පයන් ඇතිකර ගැනීමට අනුබල දීමේ දී රැකියාවල නිරත මව්වරුන් වඩාත් ප්‍රබල ලෙස බලපානු ඇත. මව්වරුන්ගේ එවැනි තීරණ දරුවන්ගේ අධ්‍යාපනයට අයහපත් අයුරින් බලපෑම් කිරීමට හැකි බව මැස්ග්‍රෝ ඉදිරිපත්කර තිබේ (ගලගමගේ 2006). මෙම ආකාරයට මවගේ සේවා නියුක්තියත් දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටමත් අතර පවත්නා සම්බන්ධය හඳුනාගත හැකි ය.

### උපකාරක පංතිවලට සහභාගී වීම

වර්තමානය වන විට අධ්‍යාපනය තුළ වඩා තරඟකාරී ස්වරූපයක් දැකිය හැකි ය. එම නිසා පාසැල් අධ්‍යාපනයට අමතර ව අමතර පංතිවලට සහභාගී වී දැනුම ලබා ගැනීමට ද සිසුන් පෙළඹී තිබේ. මෙම ආකාරයට සිසුන් අමතර පංතිවලට සහභාගී වීම ද අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන බව ඉන්ද්‍රජිත් (1997) සිදු කරන ලද පර්යේෂණයකින් අනාවරණය කරගෙන ඇත. අමතර පංතිවලට සහභාගී වීම තුළින් සිසුන්ගේ දැනුම වර්ධනයට බලපෑමක් ඇති වන බවට පවතින ආකල්පයත්, අධ්‍යාපනය සඳහා ඇති තරඟකාරී ස්වභාවයත්, සිසුන් අමතර පංතිවලට සහභාගී වීමට හේතු වේ.

### අධ්‍යයන කටයුතු සඳහා වැයකරන කාලය සහ ඒ සඳහා නිවසේ ඇති පහසුකම්

පාසලේ දී සිදුකරනු ලබන අධ්‍යාපන කටයුතුවලට අමතර ව නිවස තුළ සිදු කරනු ලබන අධ්‍යාපනික කටයුතු ද දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි බලපෑම් කරනු ලැබේ. එමෙන්ම පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට තම අධ්‍යාපන කටයුතු නිදහස් මානසික තත්ත්වයකින් කර ගැනීම සඳහා ඒ වෙනුවෙන් වෙන් කරන ලද ස්ථානයක් හෝ වෙන් කරන ලද කාමරයක් තිබීම ඉතා වැදගත් ය. කෙසේ වුවත් ගෙදර දී අධ්‍යාපන කටයුතුවල නිරත වීම අඩු හෝ කිසිවක් නොකරන සිසුන්ට කොතරම් පහසුකම් සපයා දී තිබුණත් එයින් ප්‍රතිඵලයක් අත් නොවෙයි.

### සිසුන්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම්

අධ්‍යාපන සාධනය කෙරෙහි විෂය සමගාමී ක්‍රියාකාරකම් මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම් ද වැදගත් ය. අනාගතයේ දී සමාජයට යොමුවන දරුවා එහි දී එල්ලවන අභියෝගයන්ට මුහුණ දිය යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගන්නේ විෂය බාහිර ක්‍රියාකාරකම්වලින් නිසා අධ්‍යාපනයේ දී විෂය බාහිර ක්‍රියාකාරකම්වලට වැදගත් ස්ථානයක් හිමි වේ. පාසල තුළ ක්‍රියාත්මක වන විෂය බාහිර ක්‍රියාකාරකම් අතර ක්‍රීඩා කටයුතු, ශිෂ්‍යය සමාගම් කටයුතු, ශ්‍රමදාන කටයුතු, බාලදක්ෂ කටයුතු ආදිය ප්‍රධාන තැනක් ගනී. මෙම ක්‍රියාකාරකම්වල යෙදීම තුළින් සිසුන් තුළ නායකත්ව පුහුණුව, සංවිධාන ශක්තිය, කථිකත්වය, අන්‍යයන් සමඟ සුහදව කටයුතු කිරීම වැනි ඉතා වැදගත් පෞරුෂ ගුණාංග රාශියක් වර්ධනය කර ගැනීමට හැකි වේ. එලෙස වර්ධනය කරගන්නා වූ ගුණාංග බොහෝ දුරට ඔවුන්ගේ අනාගත ජීවිතය නියමාකාරයෙන් හැඩගස්වා ගැනීමට උපකාරී වේ. එහෙත් පාසැල් පද්ධතිය දෙස බලන විට සිසුන් සියලු ම දෙනා ම එක ලෙස මෙම විෂය බාහිර ක්‍රියාකාරකම්වල නියැලීමක් දැකිය නොහැකි ය.

### පවුලේ සාමාජික සංඛ්‍යාව

පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව සහ සිසුන්ගේ සාධන මට්ටම අතර ඍණ සහසම්බන්ධයක් පවතින බව Teale 1986 සිදුකරන ලද පර්යේෂණයකින් අනාවරණය කර ඇත. එමෙන් ම රත්නාවතී 2002 සිදුකරන ලද පර්යේෂණයෙන් ද අනාවරණය කර තිබෙන්නේ පවුලේ සාමාජික සංඛ්‍යාව වැඩි වන විට දරුවන්ගේ අධ්‍යාපන සාධනය අඩු වන බව යි. පවුලේ දරුවන සංඛ්‍යාව වැඩි වන විට එක් දරුවකු වෙනුවෙන් අධ්‍යාපනය සඳහා වැය කරන මුදල් ප්‍රමාණය අඩු අගයක් ගැනීම සහ දරුවන් වෙනුවෙන් යොමු කරන අවධානය අඩුවීම යනාදිය ඒ සඳහා හේතු වශයෙන් ඇය දක්වා ඇත. මෙම ආකාරයට අධ්‍යාපන සාධනය කෙරෙහි බලපෑම් කරනු ලබන විවිධ සාධක හඳුනා ගැනීමට හැකි ය. අධ්‍යාපන සාධනය කෙරෙහි මෙම සාධක එකක් හෝ කිහිපය ම විවිධ ආකාරයට බලපෑම් කරන බව විවිධ පර්යේෂණ මගින් අනාවරණය කරගෙන ඇත .

අධ්‍යාපන සාධනයට බලපාන මෙම සාධක අතරින් සාධක කිහිපයක බලපෑම පමණක් මෙම අධ්‍යයනය තුළින් විමර්ශනය කරන ලදි. මෙම අධ්‍යයනය සඳහා යොදාගත් සාධක ලෙස දෙමව්පියන්ගේ ආදායම, මවගේ අධ්‍යාපන මට්ටම, මවගේ රැකියාව, පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව, අධ්‍යාපන වියදම, අධ්‍යාපන කටයුතු සිදු කළ කාලය, අමතර පංතිවලට සහභාගී වීම දැක්වීමට හැකි ය.

මෙලෙස අධ්‍යාපන සාධනයට බලපාන සාධක පිළිබඳව අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දුන් සිසුන් 80ක් තෝරා ගනිමින් නියැදි සමීක්ෂණය සිදුකරන ලදි. එහි දී ලැබුණු දත්ත අනුව සිසුන්ගේ සාධනීය මට්ටම සහ අනෙකුත් සාධක අතර පවත්නා සම්බන්ධය පහත පරිදි දැක්විය හැකි ය.

වගුව 01: අධ්‍යාපන සාධනය සඳහා බලපෑම් කරන සාධක අතර සම්බන්ධය

| සාධකය | Y |
|---|---|
| දෙමපියන්ගේ ආදායම( $X_1$) | .699 |
| මවගේ අධ්‍යාපන මට්ටම ($X_2$) | .385 |
| මවගේ සේවා නියුක්තිය ($X_3$) | .011 |
| පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව( $X_4$) | -.248 |
| අධ්‍යාපනය සඳහා මාසික වියදම ( $X_5$) | .639 |
| පාඩම් කටයුතු සිදු කළ කාල සීමාව ( $X_6$) | .411 |
| අමතර පංති සඳහා සහභාගී වීම ( $X_7$) | .495 |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2014

මෙහි Y යනු පරායත්ත විචල්‍යය වන සිසුන්ගේ අධ්‍යාපනයේ සාධනීය මට්ටම ය. මෙම තොරතුරුවලට අනුව දෙමව්පියන්ගේ ආදායම සහ දරුවන්ගේ අධ්‍යාපන සාධනය අතර 0.699ක ධන සහසම්බන්ධයක් පවතී. එනම් දෙමව්පියන්ගේ ආදායම අඩු වන විට දරුවන්ගේ සාධන මට්ටමේ අඩු වීමක් හෝ දෙමව්පියන්ගේ ආදායම වැඩි වන විට දරුවන්ගේ සාධනය වැඩි වීමක් හෝ සිදු වේ. මවගේ අධ්‍යාපන මට්ටම සහ දරුවන්ගේ සාධන මට්ටම අතර ද 0.385ක ධන සහසම්බන්ධයක් පවතී. එමෙන්ම මවගේ සේවා නියුක්තිය සහ දරුවන්ගේ සාධන මට්ටම අතර 0.11ක ධන සහසම්බන්ධයක් සහ මාසික අධ්‍යාපන වියදම සහ දරුවන්ගේ සාධන මට්ටම අතර 0.639ක ධන සහසම්බන්ධයක් පවතී. පවුලේ සාමාජික සංඛ්‍යාව සහ දරුවන්ගේ සාධන මට්ටම අතර පවතින්නේ 2.48ක සෘණ සහසම්බන්ධය කි. එනම් පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව වැඩි වන විට දරුවන්ගේ සාධන මට්ටම අඩු වීම හෝ පවුලේ සාමාජික සංඛ්‍යාව අඩු වන විට දරුවන්ගේ සාධන මට්ටම වැඩි වීම හෝ සිදු වේ. දරුවන් පාඩම් කළ කාලය සහ සාධන මට්ටම අතර 0.411ක ධන සහ සම්බන්ධයක් සහ දරුවන්ගේ සාධන මට්ටම සහ අමතර පංතිවලට සහභාගී වීම අතර ද 0.495ක ධන සහසම්බන්ධයක් පෙන්නුම් කර යි. මෙහි දී පැහැදිලි වන්නේ දරුවන්ගේ අධ්‍යාපන සාධනය වැඩි වශයෙන් ම සම්බන්ධයක් පවතින්නේ දෙමව්පියන්ගේ ආදායම සහ අධ්‍යාපනයට මාසිකව වියදම් කරන මුදල් ප්‍රමාණය සමඟ වන බව ය.

වගුව 02: විචල්‍යයන්ගේ වෙසෙසි බව

| | | B | t | P අගය |
|---|---|---|---|---|
| 1 | අන්තඃඛණ්ඩය | 184.615 | 3.383 | .001 |
| | $β_1$ | 103.174 | 4.024 | .000 |
| | $B_2$ | 47.979 | 2.357 | .021 |
| | $B_3$ | -20.777 | -1.073 | .287 |
| | $B_4$ | 5.636 | .690 | .492 |
| | $B_5$ | 70.900 | 2.721 | .008 |
| | $B_6$ | 55.629 | 2.862 | .006 |
| | $B_7$ | 69.132 | 3.003 | .004 |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත, 2014

$H_1$: දෙමව්පියන්ගේ ආදායම සහ දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම අතර සම්බන්ධයක් ඇත.

$H_2$: මවගේ අධ්‍යාපන මට්ටම සහ දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම අතර සම්බන්ධයක් ඇත.

$H_3$: මවගේ සේවා නියුක්තිය සහ දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම අතර සම්බන්ධයක් ඇත.

$H_4$: පවුලේ සාමාජික සංඛ්‍යාව සහ දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම අතර සම්බන්ධයක් ඇත.

$H_5$: මාසික අධ්‍යාපන වියදම සහ දරුවන්ගේ සාධන මට්ටම අතර සම්බන්ධයක් ඇත.

$H_6$: දරුවන් පාඩම් කරන කාලය සහ අධ්‍යාපන සාධන මට්ටම අතර සම්බන්ධයක් ඇත.

$H_7$: අමතර පංතිවලට සහභාගී වීම සහ දරුවන්ගේ සාධන මට්ටම අතර සම්බන්ධයක් ඇත

ඉහත සඳහන් කල්පිතයන් 95% වෙසෙසියා මට්ටම යටතේ පරීක්ෂා කරන ලදි. එහි දී දෙමව්පියන්ගේ ආදායම සහ දරුවන්ගේ සාධන මට්ටම අතර සම්බන්ධයක් නැත යන අප්‍රතිෂ්ඨය කල්පිතය ප්‍රතික්ෂේප විය. එනම් මෙම නියැදි දත්ත අනුව දෙමව්පියන්ගේ ආදායම සහ දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම අතර සම්බන්ධයක් පවතී යන වෛකල්පිත කල්පිතය පිළිගන්නා ලදි. මෙහි දී මවගේ අධ්‍යාපනය සහ දරුවන්ගේ සාධනය අතර සම්බන්ධයක් ඇත යන වෛකල්පිත කල්පිතය පිළිගනු ලබ යි. මෙම දත්ත

අනුව මවගේ සේවා නියුක්තිය සහ දරුවන්ගේ සාධනය අතර සම්බන්ධයක් නැත යන අප්‍රතිෂ්ඨය කල්පිතය පිළිගැනෙයි. එනම් මව සේවා නියුක්ත වුව ද මෙම නියැදියේ අතුළත් සිසුන් යහපත් සාධන මට්ටමක සිටින බව පැහැදිලි වේ. මෙම නියදි දත්ත අනුව පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව අධ්‍යාපන සාධනය සඳහා බලපෑමක් නැත යන අප්‍රතිෂ්ඨය කල්පිතය පිළිගනී. එනම් කුටුම්බයන්ගේ ආදායම ඉහළ නම් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වැඩි මුදලක් වෙන් කිරීමට හැකියාව ඇති නිසා පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව අධ්‍යාපන සාධනයට බලපෑමක් ඇති නොවන බව මෙම දත්ත අනුව නිගමනය කිරීමට හැකි ය. මීළඟට වෛකල්පිත කල්පිතය වන මාසික අධ්‍යාපන වියදම සහ දරුවන්ගේ සාධන මට්ටම අතර සම්බන්ධයක් ඇත යන කල්පිතය පිළිගනී. දරුවන් පාඩම් කරන කාලය සහ අධ්‍යාපන සාධන මට්ටම අතර සම්බන්ධයක් නැත යන කල්පිතය ද ප්‍රතික්ෂේප වීමෙන් තහවුරු වන්නේ දරුවන් පාඩම් කරන කාලය සහ අධ්‍යාපන සාධන මට්ටම අතර සම්බන්ධයක් පවතින බව ය. අමතර පංතිවලට සහභාගී වීම සහ දරුවන්ගේ සාධන මට්ටම අතර සම්බන්ධයක් නැත යන කල්පිතය ද ප්‍රතික්ෂේප වේ. අමතර පංතිවලට සහභාගී වීම සහ දරුවන්ගේ සාධන මට්ටම අතර සම්බන්ධයක් පවතින බව මේ අනුව පැහැදිලි වේ.

නියැදිය මගින් ලබාගන්නා තොරතුරු මෙම කල්පිතයන් යටතේ පරීක්ෂාවට ලක් කර දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම කෙරෙහි මෙම එක් එක් සාධක බලපෑම් කරන ආකාරය හඳුනා ගෙන ඇත. නියැදි දත්ත යොදා ගනිමින් ගොඩනංවන ලද බහුගුණ ප්‍රතිපායන ආකෘතිය පහත පරිදි වේ.

$$Y=184.62+103.17X_1+47.98X_2- 20.78X_3+5.64X_4+70.95X_5+55.63X_6+69.13X_7+U_i$$

මෙම බහුගුණ ප්‍රතිපායන ආකෘතිය අනුව ආදායම එක් ඒකකයකින් වැඩිවන විට සාධන මට්ටම ඒකක 103කින් වැඩි වීමක් සිදු වේ. මවගේ අධ්‍යාපන මට්ටම ඒකක එකකින් වැඩිවන විට සාධන මට්ටම ඒකක 48කින් වැඩිවන අතර මවගේ සේවා නියුක්තිය එක් ඒකකයකින් වැඩිවන විට දරුවන්ගේ සාධන මට්ටම ඒකක 21කින් අඩු වේ. එමෙන් ම පවුලේ සාමාජියන් සංඛ්‍යාව එක් ඒකකයකින් වැඩිවන විට දරුවන්ගේ සාධන මට්ටම ඒකක 6කින් වැඩි වේ. අධ්‍යාපනය සඳහා මාසික වියදම එක ඒකකයකින් වැඩිවන විට දරුවන්ගේ සාධන මට්ටම ඒකක 71කින් වැඩි වන අතර දරුවන් පාඩම් කරන කාලය එක් ඒකකයකින් වැඩි වන විට දරුවන්ගේ සාධන මට්ටම ඒකක 56කින් වැඩි වේ. එමෙන්ම දරුවන් අමතර පංතිවලට සහභාගී වීම එක් ඒකකයකින් වැඩි වන විට සාධන මට්ටම ඒකක 70කින් වැඩි වේ. මේ අනුව දරුවන්ගේ අධ්‍යාපන සාධනයට වැඩි වශයෙන් ම බලපෑම් කරන්නේ දෙමව්පියන්ගේ ආදායම බව හඳුනා ගැනීමට හැකි ය. එමෙන් ම මවගේ අධ්‍යාපන මට්ටම දරුවන්ගේ අධ්‍යාපන සාධනය අඩු වීම හෝ වැඩි වීම කෙරෙහි බලපාන අතර මවගේ

සේවා නියුක්තිය දරුවන්ගේ සාධනය අඩු වීම සඳහා බලපෑම් කරන ආකාරය ද හඳුනා ගැනීමට හැකි ය.

වගුව 03: ආකෘතිය ඇගයීම් විශ්ලේෂණය

| නිර්ණන සංගුණකය | සකසන ලද නිර්ණන සංගුණකය | D-Wඅගය |
|---|---|---|
| .819[a] | .639 | 1.247 |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2014

මෙම ආකෘතියේ නිර්ණන සංගුණකයේ අගය 0.819කි. එනම් මෙම ආකෘතියේ පරායත්ත විචල්‍යයයේ විචලනය ස්වායත්ත විචල්‍යය මගින් 82%ක් විස්තර වේ. එම නිසා මෙම ආකෘතිය හොඳ අනුසිහුමක් සහිත ආකෘතියක් බව පෙන්විය හැකි ය. එමෙන් ම මෙම ආකෘතියේ ඩර්බින් වොට්සන් අගය 1.247කි. එම අගය 02ට ආසන්න වීම මඟින් පැහැදිලි වන්නේ ආකෘතිය තුළ ස්ව සහසම්බන්ධතා ගැටලුවක් නොමැති බව යි. ඒ අනුව මෙම බහුගුණ ප්‍රතිපායන ආකෘතිය වඩාත් හොඳින් පරායත්ත විචල්‍යය විස්තර වන ආකෘතියක් බව නිගමනය කළ හැකි ය.

**සමාලෝචනය**

මෙම තොරතුරු අනුව නිගමනය කළ හැක්කේ අධ්‍යාපන සාධනය සඳහා දෙමව්පියන්ගේ ආදායම වැඩි වශයෙන් බලපෑමක් ඇති කරන බව ය. එමෙන් ම දෙමව්පියන්ගේ ආදායම අඩු වන විට දරුවන්ගේ සාධනය අඩු වන අතර ම දෙමව්පියන්ගේ ආදායම වැඩි වන විට දරුවන්ගේ සාධනය වැඩි වන බවත් නිගමනය කිරීමට හැකි ය. එමෙන් ම මවගේ අධ්‍යාපන මට්ටම ද දරුවන්ගේ සාධනය සඳහා බලපෑම් කරන බවත්, අධ්‍යාපනය සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය අඩු වන විට දරුවන්ගේ සාධනය අඩු වන බවත් අධ්‍යාපනය සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය වැඩි වන විට දරුවන්ගේ සාධනය වැඩි වන බවත් නිගමනය කිරීමට හැකි ය. එමෙන් ම දරුවන් අමතර පංතිවලට සහභාගීවීම ද ඔවුන්ගේ අධ්‍යාපන සාධනය සඳහා යහපත් ආකාරයෙන් බලපෑමක් ඇති කරන බවත් නිගමනය කිරීමට හැකි ය. එමෙන් ම මවගේ අධ්‍යාපන මට්ටම සහ දරුවන්ගේ සාධන මට්ටම අතර සම්බන්ධයක් පවතින අතර මවගේ අධ්‍යාපන මට්ටම වැඩිවන විට දරුවන්ගේ සාධන මට්ටම වැඩි වන අතර මවගේ අධ්‍යාපන මට්ටම අඩු වන විට දරුවන්ගේ සාධන මට්ටම ද අඩු වන බව මේ අනුව නිගමනය කිරීමට හැකි ය. අධ්‍යාපනය අනාගත ආයෝජනයක් වන නිසාත් අධ්‍යාපනයෙන් විවිධ ප්‍රතිලාභ අත්වන නිසාත් සෑම පුද්ගලයෙකු ම අධ්‍යාපනය ලැබීමට යොමු වේ. එබැවින් වර්තමානය වන විට අධ්‍යාපනය අත්‍යවශ්‍යය සංකල්පයක් බවට පත් ව තිබේ. මෙතෙක් බලයට පත් වූ රජයන් විසින් එක් එක් කාල වකවානුවට නැතිනම් ඉදිරි අනාගතයට

ගැළපෙන ආකාරයට අධ්‍යාපන ප්‍රතිපත්ති සහ අරමුණු වෙනස් කරමින් විවිධ අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන්නට විය. මෙම අධ්‍යාපන ප්‍රතිපත්ති සහ අරමුණු කාලයෙන් කාලයට මෙන් ම රටින් රටට ද වෙනස් වේ. එක් එක් රටවල අධ්‍යාපන ප්‍රතිපත්ති සහ අරමුණු ළඟා කරගැනීමට අධ්‍යාපනය සඳහා කිසියම් මුදල් ප්‍රමාණයක් රජය මගින් වෙන් කරන අතර සංවර්ධිත රටවල එම මුදල් ප්‍රමාණය ඉහළ මට්ටමක පවතී. අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය අනුව දරුවන්ගේ සාධන මට්ටම තීරණය වන අතර එය එම රටෙහි සාක්ෂරතා මට්ටම තීරණය වීමට ද බලපෑම් ඇති කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ඉන්ද්‍රජිත්, කේ. ජේ. (1997). *ග්‍රාමීය හා නාගරික පාසැල් වල ඉගෙනුම ලබන සිසුන්ගේ සමාජ ආර්ථික පසුබිම ඔවුන්ගේ සාධනයට බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්.* (අධ්‍යාපනපති උපාධි නිබන්ධය). අප්‍රකාශිත මුද්‍රණයː කොළඹ විශ්ව විද්‍යාලය.

ගලගමගේ, එස්. (2006). *පවුලේ රැකියා පසුබිම සහ දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා.* අධ්‍යාපනය 36. ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සංගමය. කොළඹ විශ්ව විද්‍යාලය.

රත්නාවතී, ඩබ්. ඩී. (1999). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය කුසලතා සංවර්ධනය හා සේවා වියුක්ති ප්‍රශ්නය.ප්‍රවණතා.* වෙළුම 01.

රත්නාවතී, ඩබ්. ඩී. (2003). *කුටුම්භ ආදායම දරුවන්ගේ අධ්‍යාපන වර්ධනය කෙරෙහි ඇතිකරන බලපෑම.* අප්‍රකාශිත මුද්‍රණ. කැලණිය විශ්වවිද්‍යාලය.

වික්‍රමසිංහ, ඊ.කේ. (1978).මහර අධ්‍යාපන මණ්ඩලයේ පාසැල් හැර යන්නන් පිළිබඳ විමර්ශනයක්. (අධ්‍යාපන නිබන්ධය). අප්‍රකාශිත, කොළඹ විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා මහ බැංකුව. මහ බැංකු වාර්ෂික වාර්තාව. (2013). ශ්‍රී ලංකා මහ බැංකුව. කොළඹ 01.

Benjamin, A.L. (1993).*Parent’s literacy and their children’s success in school*, Office educational research and improvement of the U.S Department of Education.

Stricht, T.G.,& Donalds, B.A. (1990). *Teach the mother and reach the child*.International bureau of education.

Teale, W.H. (1986). *Home back ground & young children’s literacy development*. Ablex publishing corp.